රුහුණ විශ්වවිද්‍යාලය

**2017/2018 අධ්‍යයන වර්ෂය**

**සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පළමු සමාසික අවසාන පරීක්ෂණය**

**2018 අගෝස්තු**

# SOC 6144 - සංවිධාන චර්යාව

ප්‍රශ්න හතරකට (04) කට පමණක් පිළිතුරු සපයන්න.

**කාලය: පැය 03 යි.**

---

01. "සංවිධාන චර්යාව" පිළිබඳ විද්‍යාත්මක කළමනාකරණ ප්‍රවේශයේ පැවති සීමාවන් මානව සම්බන්ධතා ප්‍රවේශය මගින් සම්පූර්ණ කරගත හැකි වී දැයි පරීක්ෂා කරන්න.

02. උපකල්පිත ආයතනයක් සම්බන්ධයෙන් ඔබ විසින් තෝරාගත් අභිප්‍රේරණ න්‍යායක් ඇසුරු කරගනිමින් එකී වැඩ පරිසරය තුළ පුද්ගල චර්යාව ක්‍රියාත්මක වන ආකාරය පහදන්න.

03. වැඩ පරිසරයක සමූහ චර්යාව ක්‍රියාත්මක වන ආකාරය ඊට අදාළ සංකල්ප ඇසුරින් විග්‍රහ කරන්න.

04. සංවිධාන කළමනාකරණයේදී නායකත්ව ගුණාංග උපයෝජනය කරගත හැකි ආකාරය ඊට අදාළ න්‍යායන් ඇසුරින් පහදන්න.

05. ගැටුම් කළමනාකරණ ශිල්පීය ක්‍රම යොදා ගනිමින් සංවිධාන ගැටුම් අවම කරගත හැකි ආකාරය පැහැදිලි කරන්න.

**06.** <u>(I) එක්කෝ</u>

"ආයතනගත සන්නිවේදනය" ආයතනයක අරමුණු ඉටුකර ගැනීමේදී වැදගත් වන ආකාරය නිදසුන් දෙමින් පැහැදිලි කරන්න.

<u>(II) නැත්නම්</u>

"වැඩ ජීවිතයේදී මෙන්ම පුද්ගලික ජීවිතයේදී ද ආතති කළමනාකරණය ආයතනික සංවර්ධනයට මෙන්ම පුද්ගල සංවර්ධනයට ද හේතු වේ." ඔබ එකඟ වන්නේ ද? විමසන්න.

07. "චිත්තවේග" සහ "මනෝභාව" සංවිධානයක් තුළ පුද්ගල හැසිරීමට බලපාන ආකාරය පහදන්න.

08. සම්පත් කළමනාකරණයේදී "සම්පත් යැපීම් න්‍යාය" සහ "සම්පත් පදනම් න්‍යාය" භාවිත කරගත හැකි ආකාරය පහදන්න.

(එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගිනි)

@@@@@@@@